IBO IB DIPLOMA PROGRAMME
PROGRAMME DU DIPLÔME DU BI
PROGRAMA DEL DIPLOMA DEL BI

M05/1/A1SIN/SP2/SIN/TZ0/XX

22050268

**SINHALESE A1 – STANDARD LEVEL – PAPER 2**
**SINGHALAIS A1 – NIVEAU MOYEN – ÉPREUVE 2**
**SINGALÉS A1 – NIVEL MEDIO – PRUEBA 2**

Friday 6 May 2005 (morning)
Vendredi 6 mai 2005 (matin)
Viernes 6 de mayo de 2005 (mañana)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

---

INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Answer one essay question only. You must base your answer on at least two of the Part 3 works you have studied. You may include in your answer a discussion of a Part 2 work of the same genre if relevant. Answers which are not based on a discussion of at least two Part 3 works will not score high marks.

INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- N'ouvrez pas cette épreuve avant d'y être autorisé(e).
- Traitez un seul sujet de composition. Vous devez baser votre réponse sur au moins deux des œuvres de la 3[e] partie que vous avez étudiées. Le cas échéant, vous pouvez inclure dans votre réponse une discussion sur une œuvre du même genre littéraire étudiée dans la 2[e] partie du programme. Les réponses qui ne sont pas basées sur au moins deux des œuvres de la 3[e] partie n'obtiendront pas une note élevée.

INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Elija un tema de redacción. Su respuesta deberá basarse en al menos dos de las obras estudiadas en la Parte 3. Se podrán hacer comentarios sobre una obra de la Parte 2 del mismo género, si fuera necesario. Las respuestas que no incluyan una discusión sobre al menos dos obras de la Parte 3 no recibirán notas altas.

පහත සඳහන් මාතෘකා අතුරින් එකක් යටතේ වාක්‍ය රචනයක් ලියන්න. 3 වන කොටසේ දී ඔබ හදාරා ඇති ග්‍රන්ථ අතුරින් යටත් පිරිසෙයින් දෙකක් වත් ඔබේ පිළිතුරට පදනම් විය යුතු ය. අදාළ නම් 2 වන කොටසේ ග්‍රන්ථ අතුරින් එම සාහිත්‍යාංගයටම අයත් කිසියම් කෘතියක් ගැන වුව ද පිළිතුරේ දී සාකච්ඡා කළ හැකිය. 3 වන කොටසින් යටත් පිරිසෙයින් ග්‍රන්ථ දෙකක් පිළිබඳ සාකච්ඡාවක් පදනම් කොටගෙන නොමැති පිළිතුරුවලට ඉහළ ලකුණු ගණනක් නොලැබෙනු ඇත.

සම්භාව්‍ය සාහිත්‍යය

1. එක්කෝ (අ) සම්භාව්‍ය සාහිත්‍යයෙහි වඩාත් අවධානය යොමු වී ඇති තේමාවන් කවරේද යන්න ඔබ හදාරා ඇති ග්‍රන්ථ සසඳමින් පිරික්සන්න.

නැතහොත් (ආ) සම්භාව්‍ය සාහිත්‍යයෙහි රස උද්දීපනය සඳහා යොදා ගැනෙන රචනෝපක්‍රම හා ඒවායේ සාර්ථකභාවය සංසන්දනාත්මකව පරීක්‍ෂා කරන්න.

නාට්‍ය කලාව

2. එක්කෝ (අ) නාට්‍ය කෘතියක් සාර්ථක වීම සඳහා වඩාත්ම හේතු වන්නේ එහි සංවාද හා භාෂාවයි. මේ කියමනට ඔබ එකඟ වන්නේ ද ? ග්‍රන්ථ දෙකක් සසඳමින් පිරික්සන්න.

නැතහොත් (ආ) ඔබ හදාරා ඇති නාට්‍ය කෘති අතුරින් යටත් පිරිසෙයින් දෙකක චරිත නිරූපණය සංසන්දනය කරන්න.

නවකථාව

3. එක්කෝ

(අ) ඔබ හදාරා ඇති නවකථා අතුරින් දෙකක පසුබිම නිරූපිත ආකාරයත් එම කථාවේ සාර්ථකත්වයට හේතුවන අයුරුත් පරීක්ෂා කරන්න.

නැතහොත්

(ආ) ඔබ හදාරා ඇති නවකථා අතුරින් දෙකක සාර්ථකත්වයට වඩාත්ම දායක වන්නේ කවර රචනා ලක්ෂණ දැයි සංසන්දනාත්මකව විමසන්න.

කාව්‍යය

4. එක්කෝ

(අ) නූතන කාව්‍යය සමාජය හා ඉතා කිට්ටු සම්බන්ධතාවක් පෙන්නුම් කරයි. ඔබ හදාරා ඇති කාව්‍ය ග්‍රන්ථ දෙකක් ඇසුරින් මේ සම්බන්ධතාවේ සාර්ථකත්වය පරීක්ෂා කරන්න.

නැතහොත්

(ආ) කාව්‍ය රසය ඉපදවීම සඳහා කවීන් භාවිත කරන රචනෝපක්‍රම සංසන්දනාත්මකව නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

කෙටි කතා

5. එක්කෝ

(අ) ඔබ හදාරා ඇති කෙටි කතාවල වඩාත්ම විශේෂිත වූ කෙටි කතා ලක්ෂණ වශයෙන් හඳුන්වා දිය හැක්කේ කවරේ ද?

නැතහොත්

(ආ) කෙටි කතාවක පසුබිම හා පරිසරය සාර්ථකව ඉදිරිපත් කර ඇති ආකාරය හා ඒවායින් ඉටුවන මෙහෙය කථා සංග්‍රහ දෙකක් ඇසුරින් සංසන්දනාත්මකව පරීක්ෂා කරන්න.

**පොදු ප්‍රශ්න**

6.

එක්කෝ

(අ) සාහිත්‍ය කෘතියක් සාර්ථක වීමට එහි නිරූපිත පුද්ගලයන්, අවස්ථා, මානුෂික ගැටලු යන මේ කවර දේත් විශ්වසනීය විය යුතුයි. මේ අදහස සංසන්දනාත්මකව පරීක්‍ෂා කරන්න.

නැතහොත්

(ආ) ඔබ හදාරා ඇති සාහිත්‍ය කෘති කිසිවක් මනුෂ්‍ය ස්වභාවය පිළිබඳ ඔබගේ අවබෝධය වෙනස් කිරීමට සමත් වී තිබේ ද? නිදසුන් දක්වමින් පිරික්සන්න.

නැතහොත්

(ඇ) සාහිත්‍යයෙන් අපේක්‍ෂිත වනුයේ යථාර්ථවාදී වීම මිස සත්‍යය ඇති හැටියෙන්ම ප්‍රකාශ කිරීම නොවේ. මෙම කියමන පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

නැතහොත්

(ඈ) හැම සාහිත්‍ය කෘතියකම උපදේශනාත්මක අරමුණක්ද දක්නට ලැබේ. මේ කියමනට එකඟ විය හැකි ද? ඔබ හදාරා ඇති කෘති දෙකක් ඇසුරින් පිරික්සන්න.